<u>ජාතික ආරක්ෂක අරමුදල - 2012</u>

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික ආරක්ෂක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.2.1 උසස් ගිණුම්කරණ පරිචයන්**

දේපල පිරියත හා උපකරණ සෑම අවුරුදු 03 කට හෝ 05 කට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, ජාතික ආරක්ෂක අරමුදල සතු වටිනාකම රු.11,030,000 ක් වූ ඉඩම් සහ රු.4,520,000 ක් වූ ගොඩනැගිලි 2008 අගෝස්තු 13 දිනෙන් පසුව ප්‍රත්‍යාගණනය කර නොතිබුණු අතර 1987 වර්ෂයේ දී ජාතික ආරක්ෂක අරමුදල වෙත පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු එදින වටිනාකම රු.150,000 ක් වූ මැණික් ඔබ්බවූ ඔටු රූපය එම වර්ෂයේ සිට මේ දක්වාම ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. තවද එම ඔටු රූපය 1989 වර්ෂයේ දී ජනාධිපති ලේකම් කාර්යාලයට බාර දුන් බව ලිඛිතව සනාථ කළද සමාලෝචිත වර්ෂය අවසානයේදී එහි භෞතික පැවැත්ම අරමුදල විසින් සනාථ කරගෙන නොතිබුණි.

**1.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සහ මුදල් රෙගුලාසි 502 (2) ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම්වලින් ජනනය වූ මූල්‍ය ප්‍රතිඵලය රු.57,510,514 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.48,835,628 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.8,674, 886 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණේ ආයෝජන පොලී ආදායම රු.15,887,298 කින් හෙවත් සියයට 32.8 කින් වැඩිවීමයි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

තම රාජකාරී කටයුතු ඉටුකරන අතරතුර දී තුවාල ලද හෝ මියගිය පොලිස් බලකායේ හෝ සන්නද්ධ හමුදාවල හෝ යම් සාමාජිකයෙකුගේ පවුල්වලට යම් පතිලාභ ගෙවීම ඇතුළුව ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමට සහ සහතික කිරීමට වඩාත්ම හේතු වන්නේ යයි මණ්ඩලය අදහස් කරන ආකාරයට සහ කාර්යයන්ට අරමුදලට අයත් මුදල් ජනාධිපතිවරයාගේ විධානවලට යටත්ව යොදා ගැනීම මණ්ඩලයේ කාර්යය වී තිබුණද, වාර්ෂිකව උපයන ආදායම අදාල අරමුණු සඳහා උපයෝගී කර ගැනීම ඉතා දුර්වල තත්ත්වයක පැවතිණි. පසුගිය වර්ෂ 05 ක් තුළ ලැබී තිබුණු ආදායම් සහ ඊට අදාලව දරා තිබුණු සුභසාධන වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ලැබී ඇති මුළු ආදායම | සුභසාධන වියදම | ලද ආදායමෙන් සුභසාධන වියදම් සඳහා වැය කර ඇති ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | % |
| 2012 | 64,988,177 | 7,238,435 | 11.14 |
| 2011 | 49,082,045 | - | 0 |
| 2010 | 75,509,010 | 40,108,739 | 53.12 |
| 2009 | 78,037,379 | 5,500,000 | 7.05 |
| 2008 | 69,726,492 | 21,421,412 | 30.73 |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

යුධ හමුදාවේ පරිහරණය සඳහා කුලියට ලබා දී තිබුණු අරමුදල සතු නිවාස 3 සඳහා 2012 වර්ෂයට අයවිය යුතු කුලී රු.55,500 ක් 2013 ජුලි 19 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. මෙහි අවසන් වරට කුලිය සංශෝධනය කර තිබුණේ 2006 වර්ෂයේදී වන අතර වසර 7 ක් ඉක්මවා තිබුණත් මාසික ගෙවල් කුලිය සංශෝධනය සඳහා අවධානය යොමුවී නොතිබුණි.

### 3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල වෙනුවෙන් රු.321,835 ක වියදමක් ජංගම ගිණුමෙන් වැයකර තිබුණු අතර එහි මාසික සාමාන්‍ය රු.26,820 ක් විය. එහෙත් සමාලෝචිත වර්ෂය පුරා කිසිදු ප්‍රතිලාභයක් නොමැතිව නිෂ්කාර්යව එම ජංගම ගිණුමේ රඳවා තිබුණු අරමුදලේ අතිරික්ත මුදල්වල මාසික සාමාන්‍ය රු.683,794 ක් විය. මෙය ඵලදායි ආයෝජනයක යොදවා නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් , පලාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පලාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් ජාතික ආරක්ෂක අරමුදල විසින් වර්ෂය ආරම්භයේදි පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 4.2 වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

ඉහත ( 5.1 ) හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකුලව 2010 සහ ඉන් ඉදිරියට ජාතික ආරක්ෂක අරමුදල විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාර සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 4.3 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ඉහත (5.1) හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දින හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402 (1) ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත ජාතික ආරක්ෂක අරමුදල විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිට පිටපත් සහිතව පාර්ලමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 අගෝස්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 4.4 ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වනවිටත් පිළියෙල කර නොතිබුණි.

### 4.5 පාලක මණ්ඩල රැස්වීම්

ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේ ද පාලන මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර අරමුදලේ ලේකම්වරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) අතිරික්ත මුදල් ආයෝජනය කිරීම.

**ඇමුණුම - 01**

**ජාතික ආරක්ෂක අරමුදල 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශය**

| ආදායම් | 2012 | 2011 |
|---|---|---|
| | රු. | රු. |
| පරිත්‍යාග | 39,820 | 20,986 |
| ආයෝජන පොලී | 64,282,357 | 48,395,059 |
| ගෙවල් කුලී | 666,000 | 666,000 |
| | 64,988,177 | 49,082,045 |
| **වියදම්** | | |
| කාර්ය මණ්ඩල දීමනා | 20,400 | 20,400 |
| සුභ සාධන වියදම් | 7,238,435 | - |
| ගොඩනැගිලි ක්ෂය | 184,078 | 193,767 |
| රණවිරු පරිත්‍යාග | 34,750 | 32,250 |
| | 7,477,663 | 246,417 |
| වියදමට වැඩි ආදායම | 57,510,514 | 48,835,628 |

ඇමුණුම - 02

**මුදල් ආයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශය**

| ආයෝජන ආයතනය | ගිණුම් අංකය | ආයොජනය කළ දිනය | කාල සීමාව | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | | | (අවු) | රු. |
| ජාතික ඉතිර්කිර්මේ බැංකුව | 2/0001/19/88646 | 2012 අගෝස්තු 28 | 01 | 106,340,216 |
| භාණ්ඩාගාර බිල්පත් | LKA 36413G198 | 2012 ජුලි 20 | 01 | 66,413,739 |
| ජාතික ඉතිර්කිර්මේ බැංකුව | 2/0065/11/54001 | 2012 සැප්තැම්බර් 21 | 01 | 87,135,436 |
| ජාතික ඉතිර්කිර්මේ බැංකුව | 2/0065/11/61784 | 2012 ජුනි 27 | 01 | 83,190,626 |
| ජාතික ඉතිර්කිර්මේ බැංකුව | 2/0065/11/61750 | 2012 ජුනි 27 | 01 | 78,031,913 |
| ජාතික ඉතිර්කිර්මේ බැංකුව | 2/0065/11/61768 | 2012 ජුනි 27 | 01 | 99,828,736 |
| භාණ්ඩාගාර බිල්පත් | LKA 36412L 281 | 2012 දෙසැම්බර් 28 | 01 | 45,325,620 |
| ජාතික ඉතිර්කිර්මේ බැංකුව | 2/0065/11/25753 | 2012 මාර්තු 24 | 01 | 60,863,322 |
| ජාතික ඉතිර්කිර්මේ බැංකුව | 2/0065/10/25058 | 2012 මාර්තු 31 | 01 | 400,000 |

| | | | | |
|---|---|---|---|---|
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2/0065/11/29465 | 2012 ජුනි 30 | 01 | 8,604,999 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2/0065/11/61776 | 2012 ජුනි 30 | 01 | 11,071,998 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2/0065/11/14085 | 2012 ජුලි 16 | 01 | 1,842,620 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2/0065/11/14077 | 2012 ජුලි 16 | 01 | 1,842,620 |
| භාණ්ඩාගාර බිල්පත් | 000B SCB 11140005 | 2012 අප්‍රේල් 20 | 01 | 5,388,449 |
| භාණ්ඩාගාර බිල්පත් | 000B NRP 110490023 | 2012 පෙබරවාරි 21 | 01 | 3,215,408 |
| මහජන බැංකුව | 0033 - 261 - 070152 - 4 | 2012 සැප්තැම්බර් 30 | 01 | 25,013 |
| | | | | 659,520,715 |